පන්තිය: 12

විෂය: ජීව විද්‍යාව

සතිය: ඔක්තෝබර් 01-07

1.ඒකකය : ශාක ආකාරය හා ක්‍රියාකාරීත්වය

2.ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

- මෙම පාඩමට අදාළව ඊ නැණ පියස , ඊ තාක්ෂලාව වෙබ් සයිට් වලට පිවිස වැඩිදුර හැදැරීම් කරන්න.
- ඒවායේ ඇතුලත් ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ආධාරක

ඊ නැණ පියස

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=549

ඊ තක්ෂලාව

https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=447#section-4

https://youtu.be/xeBgBFLaNB0?list=PLlyv4_Vxwl-xzFEqsZxoEqnkKS2ZObUo0

4.ඉගෙනුම් ඵල

විභාජක සෛලවල ලාක්ෂණික ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- ශාක දේහයේ පවතින ස්ථානය අනුව විභාජක පටක වර්ග තුන නම් කරයි.
- එක් එක් විභාජක පටක වර්ගයේ කාර්යභාරය විස්තර කරයි.
- අග්‍රස්ථ විභාජකයක (කඳේ/මුලේ) අනු පිළිවෙළින් පවතින ප්‍රධාන කලාප ලෙස සෛල විභජන, සෛල දික් වන හා සෛල විභේදන කලාප තුන රූප සටහනක් ඇසුරෙන් හඳුනාගනී.
- අග්‍රස්ථ විභාජකයකින් හට ගෙන විභේදනය වන මූලික පටක වර්ග තුනක් ලෙස ප්‍රාක්චර්මය, පූරක විභාජකය හා ප්‍රාක්කැම්බියම නම් කරයි.
- කඳ අග්‍රස්ථයේ හා මූල අග්‍රස්ථයේ ව්‍යුහීය වෙනස්කම් සන්සන්දනය කර ලැයිස්තු ගතකරයි.
- ප්‍රරෝහ අග්‍රස්ථයේ හා මූල අග්‍රස්ථයේ ඇති වන පටක පද්ධති ආකාර තුනක් ප්‍රකාශ කරයි (චර්මීය පටකය, පූරක පටකය, සනාල පටක පද්ධති).
- ප්‍රධාන පටක පද්ධති වර්ග තුනක අයත් ව්‍යුහ නම් කරය අපිචර්මයේ හා පාලක සෛලවල දළ ව්‍යුහය හා කෘත්‍ය ප්‍රකාශ කරයි.
- සරල පූරක පටකයේ ව්‍යුහය කෙටියෙන් පැහැදිලි කරයි : මෘදුස්තර, ස්ථුල කෝණාස්තර හා දෘඪස්තර සෛල
- මෘදුස්තර, ස්ථුලකෝණාස්තර හා දෘඪස්තර සෛලවල කෘත්‍ය කෙටියෙන් සඳහන් කරයි.
- සෛලම පටකයේ ව්‍යුහය හා කෘත්‍ය කෙටියෙන් පැහැදිලි කරයි.
- ෆ්ලෝයම පටකයේ ව්‍යුහය හා කෘත්‍ය කෙටියෙන් පැහැදිලි කරයි.
- ආලෝක අන්වීක්ෂය භාවිතයෙන් අපිචර්මීය, පූරක හා සනාල පටක පද්ධතිවල සෛල ආකාරවල ඇති විශිෂ්ට ලක්ෂණ හඳුනා ගනියි.
- ශාකවල අදාළ කෘත්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ශාක පටක හා ඒවායේවිභේදන පරිණාමය වී ඇති බව පිළිගනියි.